## බුද්ධශාසන අරමුදල - 2014

බුද්ධශාසන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත බුද්ධශාසන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනතේ 12(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) හි ඇතුලත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයිම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 අනුව සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් ප්‍රයෝජනයට ගනු ලබන පිරිවැය රු.155,380 ක් වූ පරිගණක හා උපකරණවල සාධාරණ අගයක් පෙන්නුම් නොකෙරෙන බැවින් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.40,000 ක් වූ සාමණේර ආයතන දීමනාව ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) අගරු චෙක්පතක් වෙනුවට නව චෙක්පතක් නිකුත් කිරීමේදී චෙක්පත අගරු වීම ගිණුම් ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු. 98,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) විකිණීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී තිබුණු මුළු වටිනාකම රු.11,944,380 ක් වූ පොත් තොගයක් වර්ෂ හතරක කාලයක සිට ලැබිය යුතු අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද විකුණා ඇති පොත් ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙන අදාල ගැලපීම් කර නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පොත් විකිණීමෙන් ලැබුණු රු.50,840 ක ලාභය ආදායම් වියදම් ගිණුමට බැර කිරීමෙන් තොරව සෘජුවම බුද්ධශාසන අරමුදල් ගිණුමට බැර කිරීම හේතුවෙන් වසරේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් ගිණුම් අයිතමයන් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගණුදෙනු විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) බෞද්ධ ධර්ම ග්‍රන්ථ | 14,613,004 | විස්තර ඇතුලත් ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ආ) පොත් අලෙවි ආදායම | 1,007,982 | අලෙවි ආදායම් වාර්තා, ලදුපත් |

| | | |
|---|---|---|
| (ඇ) පාලි ටීකා සිංහල පරිවර්තන සඳහා ගෙවිය යුතු මුදල | 544,409 | ශේෂ සනාථ කිරීම් |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයට ගෙවිය යුතු රු.325,000 ක් 2007 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම විශ්ව විද්‍යාලයේ තොරතුරු වලට අනුව එවැනි වගකීමක් අරමුදලට නොමැති බව ප්‍රකාශ කළද ඒ පිළිබඳ පරීක්ෂා කර අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනත : | |
| (i) 4.1 වගන්තිය | පාලක මණ්ඩලයට සහාය වීම සහ උපදෙස් දීම සඳහා උපදේශක කමිටුවක් පත්කර නොතිබුණි. |
| (ii) 17 වගන්තිය | අරමුදල ආදායම්බදු වලින් නිදහස් වුවද ස්ථාවර තැන්පත් සඳහා වූ පොළී ආදායම් වලින් අයකරගෙන තිබුණු රු.578,481ක බදු මුදල නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) **2006 දෙසැම්බර් 22 දිනැති අංක පී.එෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය :** | |
| (i) 4.2(ආ) ඡේදය | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 09 කදී භාරගත් රු.47,960,300 ක් වටිනා පරිත්‍යාග ඇතුළු අනෙකුත් ලැබීම් සඳහා ලදුපත් නිකුත් කර නොතිබුණි. |
| (ii) 4.2 (ඇ) ඡේදය | බැංකු ගිණුම් පිළිබඳ පොත් පත් හා සසඳා කාර්තු වශයෙන් වාර්තා සකස්කර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) 4.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුලත අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ කාර්යසාධන වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක්ද සහිතව විගණකාධිපතිට ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2015 මැයි 11 දිනය. නමුත් |

එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
මුදල් රෙගුලාසි 754

අරමුදල විසින් බඩු වට්ටෝරු පොතක් භාවිතා කළද එය විධිමත් පරිදි පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර වර්ෂය තුළ මිලදී ගත් භාණ්ඩ හා අමාත්‍යාංශයෙන් ලද භාණ්ඩ බඩු වට්ටෝරු පොතෙහි සටහන් කර පාලනය කිරීමට පියවර ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අරමුදල සතු බඩු වට්ටෝරු පොත තුලනය කර නොතිබුණි.

**2.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු.**

2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අරමුදලට ලැබී තිබූ මුළු පරිත්‍යාග මුදලින් සියයට 84 ක් එනම් රු.57,105,404 ක මුදලක් ලැබී තිබුනේ පෞද්ගලික සමාගමකින් වන අතර එම පරිත්‍යාග අරමුදල හරහා, විහාර සංවර්ධන සමිතියක් මඟින් සිදු කරන බුදු පිළිමයක් නෙලීමේ කටයුත්තක් සඳහා මුදාහැර තිබුණි. මෙම පරිත්‍යාග මාරුකිරීම සඳහා අරමුදල අතරමැදියකු ලෙස කටයුතු කිරීම ආයතනයේ අරමුණු හා එකඟ නොවන අතර මෙමඟින් රජයට අහිමිවන බදු ආදායම පිළිබඳ සැලකිළිමත් වී නොතිබුණි.

**2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු.**

(අ) බැංකුවේ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.76,089 ක තැන්පත් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව පොත්වලින් ලියා හැර තිබුණි.

(ආ) රාජ්‍ය බැංකු 3 ක ආයෝජනය කර තිබූ එකතුව රු.432,035,581 ක් වන භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අරමුදලට ලැබී තිබුණු පරිත්‍යාග වලින් සියයට 1 ක මුදලක් එනම්, රු.450,226 ක් නිසි අධිකාරී බලයකින් තොරව අරමුදලේ ආදායම් ලෙස රඳවාගෙන තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම සහ වියදම පිළිවෙළින් රු. 39,502,102ක් හා රු.7,100,198 ක් වූයෙන් එහි මූල්‍ය ප්‍රතිඵලය රු.32,401,904 ක අතිරික්තයක් විය. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම සහ වියදම පිළිවෙළින් රු. 45,604,422 ක් සහ රු. 3,623,195 ක් වූයෙන් ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 41,981,227 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 9,579,323 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ ආයෝජන ආදායම රු. මිලියන 7 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බුද්ධශාසන අරමුදලේ කාර්යභාරය වනුයේ බුද්ධශාසනය ආරක්ෂා කර ගැනීම සහ පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍යයැයි පාලක මණ්ඩලය සලකන ආකාරයට සහ එසේ සලකනු ලබන කාර්යය සඳහා මුදල් යෙදවීම වුවත්, සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 441 ක ආයෝජනයකින් සමන්විත වූ බුද්ධශාසන අරමුදල මගින් බුද්ධශාසනයේ උන්නතිය වෙනුවෙන් වැය කර තිබුණේ රු. මිලියන 7 ක් හෙවත් සමස්ත ආදායමින් සියයට 18 ක් පමණි. එසේ හෙයින්, මුදල් ආයෝජනයෙන් පොළී රැස්කරගැනීම හැර බුද්ධශාසනයේ උන්නතිය වෙනුවෙන් අරමුදලෙන් සැලකිය යුතු කාර්යභාරයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) බුද්ධශාසන අරමුදලේ පාලක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් අනුව පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීම, මුද්‍රණය කිරීම සහ විකිණීම යන කටයුතු පෞද්ගලික මුද්‍රණාලයකට පවරා ඒ සඳහා අවස්ථා 4 ක දී එකතුව රු.7,489,275 ක් ගෙවා තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොත් මුද්‍රණය කර විකිණීමෙන්, අරමුදලට ලැබිය යුතු රු.3,696,212 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) පරිවර්තනය කළ සහ මුද්‍රණය කළ පොත් සංඛ්‍යාව,විකුණන ලද පොත් සංඛ්‍යාව,ඉතිරි පොත් සංඛ්‍යාව, වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි අරමුදල විසින් ලේඛන සකස් කර නොතිබුණු අතර පෞද්ගලික ආයතනයක් විසින් සපයනු ලබන වාර්තා පදනම්ව ගිණුම් සකස් කර තිබුණි.

(iii) පොත් පරිවර්තනය කිරීම සහ මුද්‍රණය කිරීම සම්බන්ධව විධිමත් පාලනයක් පවත්වා ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(ඇ) පාලි අට්ඨ කතා ග්‍රන්ථ 12 ක් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම සඳහා අත්තිකාරම් වශයෙන් රු.1,080,165 ක මුදලක් පෞද්ගලික ආයතනයකට 2010 වර්ෂයේදී ගෙවා තිබුණි. අට්ඨ කතා ග්‍රන්ථ 12 න් 06 ක් පමණක් පරිවර්තනය කර මුද්‍රණය කර තිබූ අතර මෙම මුද්‍රිත ග්‍රන්ථ කිසිවක් අරමුදල වෙත ලබාගැනීමට හෝ විකිණීමට හෝ මෙතෙක් කටයුතු කර නොතිබීම හේතුවෙන් පාලි අට්ඨ කතා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීමේ ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඈ) සාමණේර කැපකරු දායක ක්‍රමයට අයත් රු. මිලියන 28 ක ආයෝජනය තුළින් ලැබෙන පොළී ආදායමෙන් දායක ක්‍රමය ක්‍රියාත්මක කළ යුතුව තිබුණද ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද, එය නිසි පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඉහත ආයෝජනයෙන් රු. 2,924,716 ක වාර්ෂික පොළී ආදායමක් උපයා තිබුණු නමුත් විධිමත් සැලසුමක් නොවීම නිසා සාමණේර කැපකරු දායක ක්‍රමයට දායක කර තිබුණේ ඉන් රු.1,629,460 ක් හෙවත් සියයට 55 ක් පමණි. සාමණේර කැපකරු දායක ක්‍රමය සඳහා එක් හිමිනමකට මාසිකව රු.500 ක දීමනාවක් පමණක් ගෙවනු ලබන අතර කාලීනව එය සංශෝධනය කිරීමට අරමුදල කටයුතු කර නොතිබුණි.

**4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(අ) සුනාමි ආධාර සහ සිව්පස ආධාර ලෙස ලද පිළිවෙලින් රු.1,448,096 ක් හා රු.1,348,796 ක මුදල් අදාල කාර්යයන් සඳහා යෙදවීමකින් තොරව වර්ෂ 10කට අධික කාලයක් බැංකුවේ තැන්පත් කර තිබුණි.

(ආ) වටිනාකම රු.317,400 ක් වූ බුද්ධ ජයන්ති කාසි තොගය විකිණීමෙන් තොරව වර්ෂ 4 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

සාමණේර ආයතන මාසික දීමනා ගෙවීම් සම්බන්ධයෙන් පහත දුර්වලතා හා අඩුපාඩු නිරීක්ෂණය විය.

(ii) 2011 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වන සාමණේර ආයතන 20 ක් ඇති බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය වාර්තා සමඟ ආයතන 17 කට අදාළ තොරතුරු පමණක් ඉදිරිපත් කර තිබුණි.

(iii) සාමණේර ආයතන සඳහා ගෙවීම් ලේඛනයක් නඩත්තු කළද එය විධිමත්ව හා සම්පූර්ණ තොරතුරු ඇතුලත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් මෙන්ම සමාලෝචිත වර්ෂයේදී විගණන විමසුම් 03ක් මඟින් පෙන්වා දෙන ලද වටිනාකම රු.මිලියන 28 ක විගණන ඡේදවලට අදාල කරුණු සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අරමුදල් ආයෝජනය හා උපයෝජනය
(ආ) ගිණුම්කරණය
(ඇ) කාර්යසාධනය
(ඈ) පොත් මුද්‍රණය , විකිණීම හා ගබඩාකරණය.